රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 4000 ස්ථලය (පුනර්)

පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්

# SLS 4102 - අභිලේඛන සහ පුරාක්ෂර විද්‍යාව

පළමුවැනි හා හයවැනි ප්‍රශ්නය ද කොටස් දෙකෙන්ම තෝරාගත් තවත් ප්‍රශ්න තුනක් ද ඇතුළු ව ප්‍රශ්න <u>පහකට (05)</u> පිළිතුරු සපයන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.

කාලය : පැය 03 යි.

---

## I කොටස

01. සපයා ඇති සෙල්ලිපිවල අ, ආ, යන කොටස් වත්මන් සිංහල අකුරුවලට නගන්න.

(ලකුණු 22)

02. අභිලේඛන යනු කවරේදැයි හඳුන්වා අභිලේඛන වර්ග පිළිබඳ පැහැදිලි කරන්න.

(ලකුණු 12)

03. භාෂා පරිණාමය හැදෑරීමෙහි ලා අභිලේඛන අධ්‍යයනය වැදගත්වන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

04. සිංහල ප්‍රාකෘත යුගයෙහි රචිත ශිලාලේඛනවලින් හඳුනාගත හැකි භාෂා ලක්ෂණ කවරේදැයි සනිදර්ශන ව පහදන්න.

(ලකුණු 12)

05. තත්කාලීන සමාජ සංස්කෘතික කාරණා අවබෝධ කරගැනීමෙහි ලා තෝනිගල ලිපියෙහි වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

## II කොටස

05. (i) පහත දැක්වෙන අභිලේඛන පාඨවල අදහස වත්මන් සිංහල බසින් ලියන්න.
(ii) අංකිත පදවලට විවරණ සපයන්න.

(ලකුණු 22)

(අ) බඩකරි(ක පරු)මක තිශ පුත බඩකරික පරුමක මගහ ලෙණෙ ශගශ
උපශක නගමිතහ බරියය උපශික (ශි)ලය ලෙණෙ ශගශ
පරුමක පොතිමශහ පුත උතිය ච ශොමදෙවහ ච අගත අනගත ශගශ
ගුත පුතහ පරුමක පුරහ ලෙණෙ අගතගත චතුදිශ ශගශ

26

(ආ) ලක්දිව තෙලෙහි ඔකාවස් රජපරපුරෙන් බට සැක කුළලෙහි රජපරපුරු

පුවත්නා තාක් මෙකුන් දරුමුනුබුරන් ව මෙකුන්ගෙ අන්වය ආවූ සෙ දඩමුඩු ගතැ සිතු වර –

දෙකැ බසින් පටවා කරන දැහැවිල්ලෙන් මුත් දඩමුඩු නො ගන්නා ව දැගැ ලා නො පටනු ව

දිවි දී නො මුස්නා ඥෙහයකුදු කළ කුත් වරක් දක්වා ෂමා කරනු ම පෙත් පමුණු නො ගන්නා කො –

ට යම් පමණ ද්‍රොහයකුදු කළ අභය දී දැකැසියවත් මුත් නිග්‍රහ නො කරනු කොට සත් විසි වන්නෙහි

කැත්කෙහි අව සතවක් දවස් පිවිත් මත්කෙහි මෙ වැ [ව*] සො කළ බවට දෙමළලෙස් දරු පොතැ අක්වර ලියන දෙවිහි.

(ඇ) ගමලද්දන් ගැත්ත –
–ත් මත්දඩින් හිත්ද වි–
– තාර කොට පිරිකපා
ත[බා] දුන් දඩ ගනුත්
මිසැ ගම වටා ගෙනැ
ගෙ තිර ගෙනැ දව
නො එල්වනු ඉසා [1*–]
දඩ ගැම හිත්ද එ (ළ්) –
– වත් මිසැ කුඩින්
ගැමින් පිටත් කොට
නො ගෙනැ යනු ඉසා [1*–]
නොපිරිකැපු දඩට
වැලැක්මෙ නො ගත් –
– නා කොට ඉසා [1*–] ළ

දඩට සවාම් ගිනු –
– ත් මිසැ අබුදරු –
– වත් වැලැක්මෙ නො
ගන්නා ඉසා [1*–] ගම
ට ආ රදෙලන් රහ
මස් දිහි තෙල් නො
ගන්නා ඉසා [1*–] වතු) –
පෙත් වත් වැදූ රහ
නො ගන්නා ඉසා [1*–]
සොරවෙළඳම් නො

07. ඓතිහාසික තොරතුරු ගවේෂණයෙහි ලා පනාකඩුව තඹ සන්නසෙහි වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

08. "පුරාතන ලක්දිව වෙළඳාමෙහි ස්වභාවය පිළිබඳ තොරතුරු රැසක් බදුලු ටැම් ලිපියෙන් ප්‍රකට වේ." පරීක්ෂා කරන්න.

(ලකුණු 12)

09. "වංශ කථාවලින් හෙළිවන තොරතුරුවල විශ්වසනීයත්වය අභිලේඛනවලින් සනාථ වේ." උක්ත කියමන සනිදර්ශන ව පහදන්න.

(ලකුණු 12)

@@@@@@@@@

([illegible])

(i)



(ii)



(i)



(ii)



(iii)



(iv)



(V)

